# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2019 අංක 19 දරන
## එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2019 ඔක්තෝබර් මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2019 නොවැම්බර් මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 8.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2019 අංක 19 දරන
## එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2019 ඔක්තෝබර් මස 31 වන දින]

එල්. ඩී.— ඕ. 5/2019

### 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2019 අංක 19 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 6 වන වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:- 2002 අංක 14 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"ආනයනය කළ භාණ්ඩවල වටිනාකම.

6. (1) නියෝග මගින් නියම කරනු ලබන භාණ්ඩ හැර ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම-

(අ) තීරුබදු කාර්යය සඳහා නිශ්චය කරන ලද භාණ්ඩවල වටිනාකම සියයට දහයකින් වැඩි කළ අගය; සහ

(ආ) ඒ භාණ්ඩ සඳහා ගෙවිය යුතු යම් තීරුබදු මුදලට ගෙවිය යුතු යම් අධිභාරයක්, සෙස් බද්දක්, 2002 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවිය යුතු වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දක් සහ 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවිය යුතු යම් නිෂ්පාදන බද්දක් ද ඇතුළුව ගෙවිය යුතු මුදල් ප්‍රමාණය,

යන දෙකෙහි එකතුව විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබූ භාණ්ඩවල වටිනාකම නිශ්චය කරනු ලබන ආකාරය අමාත්‍යවරයා විසින්, කලින් කල, නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා

විසින් සාදනු ලබන එවැනි යම් නියෝගයක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු අතර, *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු ය. එම නියෝග පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු අතර, පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන් අනතුරුව පමණක් බලාත්මක වන්නේ ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

''(අ) භාණ්ඩ සැපයුම්කරු විසින් භාණ්ඩ අපනයනය කරනු ලැබ ඇති අවස්ථාවක දී, එම භාණ්ඩ ශුන්‍ය අනුප්‍රමාණගත කළ යුතු ය;

මේ ඡේදයේ කාර්යය සඳහා යම් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු, ඔහු විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත දී කරගෙන යනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘතියක් සඳහා භාවිත කිරීම පිණිස සපයනු ලබන යම් භාණ්ඩ, එම කොන්ත්‍රාත්කරු විසින් අපනයනය කරන ලද භාණ්ඩ ලෙස සැලකිය යුතු ය; සහ''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ පළමුවන අතුරු විධානයේ (අ) ඡේදයේ (iii) වන සහ (iv) වන අනුඡේද ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින්:-

''(iii) රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති කාන්තා යට කලිසම් (panties), මේස්, පිරිමි යට කලිසම් (briefs) සහ බොක්සර් කොට කලිසම් හැර එවැනි එක් එක් ඇඟළුමක් සඳහා 2018 අගෝස්තු

මස 16 වන දින හෝ එදිනට පසුව එහෙත් 2019 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා රුපියල් හැත්තෑපහක් වන අතර, 2019 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා රුපියල් සියයයි;

(iv) රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති කාන්තා යට කලිසම් (panties), මේස්, පිරිමි යට කලිසම් (briefs) සහ බොක්සර් කොට කලිසම් කෑලි හයක් සඳහා 2018 අගෝස්තු මස 16 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2019 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා රුපියල් හැත්තෑපහක් වන අතර, 2019 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා රුපියල් සියයයි;''.

(2) (3) වන උපවගන්තියේ හතරවන අතුරු විධානයේ ''සියයට දොළහකට සීමා කළ යුතු ය.''යන වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

''සියයට දොළහකට සීමා කළ යුතුය:

එසේම තවදුරටත්, සහාධිපත්‍ය නිවාස ඒකක සැපයුම් සිදු කරන සහ සියයට හයේ අනුප්‍රමාණය අනුව නිමැවුම් ගණනය කරන යම් තැනැත්තකු, ඔහුට ලැබුණු එම සැපයුම්වල වටිනාකම මත සියයට පහකට වඩා වැඩි අනුප්‍රමාණයක් මත ඒ තැනැත්තා විසින් යෙදවුම් බද්ද ගෙවා තිබෙන අවස්ථාවක දී වුව ද, මේ පනත යටතේ ඉඩදිය හැකි යෙදවුම් බද්ද වශයෙන් ඒ සැපයුම වෙනුවෙන් සියයට පහේ අනුප්‍රමාණය අනුව පමණක් අඩු කිරීමට හිමිකම ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය, එහි (1අ) වන උපවගන්තියේ ''2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2019 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීම මඟින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) ඒ කොටසේ (ආ) ඡේදයේ (xi) වන අයිතමයේ-

(අ) (ආ) වන අනු අයිතමයේ, "2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු, එහෙත් මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව යම් තැනැත්තකු විසින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු, එහෙත් 2019 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව යම් තැනැත්තකු විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (ඇ) අනු අයිතමයේ "රුපියල් මිලියන පහළොවක් නොඉක්මවන්නා වූ සැපයුම්."; යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන්නා වූ සැපයුම්; හෝ

(iii) එම සැපයුම් යම් සහාධිපත්‍ය නිවාස ඒකකයක විකිණීමකට සම්බන්ධ සහ එම සැපයුම සම්බන්ධයෙන් මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනතේ විධිවිධාන යටතේ ලියා අත්සන් කරන ලද විකිණීමට එකඟවීමේ ගිවිසුමක් ඇති අවස්ථාවක දී; හෝ

(iv) එම සැපයුම්, අදාළ පළාත් පාලන ආයතනය විසින් මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව නිකුත් කරන ලද අනුකූලතා සහතිකයක් ඇති සහාධිපත්‍ය නිවාස ව්‍යාපෘතියක සහාධිපත්‍ය නිවාස ඒකකයක් සැපයීම සම්බන්ධයෙන් වන අවස්ථාවක දී,

2019 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි.";

(2) (ආ) ඡේදයේ (xxvi) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින්:-

"(xxvi) සීනි හෝ වෙනත් රස කළ ද්‍රව්‍ය අඩංගු කිරිපිටි හැර, එම කිරි ලංකාවේ නිෂ්පාදනය කරන තාක් දුරට දේශීයව නිෂ්පාදිත නැවුම් කිරිවලින් නිෂ්පාදනය කළ කිරි නිෂ්පාදන සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද සහල් අඩංගු දේශීයව නිෂ්පාදිත සහල් නිෂ්පාදන සහ, 2019 නොවැම්බර් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි දේශීයව නිෂ්පාදිත සහල්වලින් දේශීයව නිෂ්පාදිත සහල් නිවුඩු තෙල්;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.